# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/14/2020 (PSC)

අයි.සී.පෙරේරා,
372 ඒ, දිගනතුඩුව,
පමුණුගම,
අඑබෝමුල්ල.

අභියාචක

එදිරිව

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

වගඋත්තරකරු

දිනය :-2025.04.23

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක අයි.සී.පෙරේරා
අභියාචක වෙනුවෙන් නීතිඥ උදාර පෙරේරා මහතා
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් කේ.ඒ.කේ.ඩබ් පෙරේරා මිය

ජේ.ජේ.රත්නසිරි මහතා - (සාමාජික) පරි. අභි.විනි. අධිකාරය

## -නියෝගය-

අභියාචක අයි.සී.පෙරේරා, තැපැල් සේවකයෙකු ලෙස 1992 වසරේ සිට පානදුර තැපැල් කාර්යාලයේ සේවය කරනු ලබයි. 2010 වසරේ ඒකාබද්ධ තැපැල් සේවයේ 1 "ආ" කාණ්ඩයේ 1 "ආ" ශ්‍රේණියේ තැපැල් සේවා නිලධාරී උසස්වීම් නොලැබීම පිළිබඳව 2017.12.08 දින රාජ්‍ය සේවා කොමිෂමට යොමු කළ අභියාචනය, රාජ්‍ය සේවා කොමිෂමේ අංක PSC/APL/9/106/2017 හා 2020.01.16 දින දරණ ලිපිය මගින් ප්‍රතික්ෂේප කර ඇත. එම තීරණයෙන් තෘප්තිමත් නොවූ අභියාචක, අභියාචකගේ 2020.01.22 දින AAT/14/2020(PSC) දරණ අභියාචනය මෙම අධිකාරයට ඉදිරිපත් කර ඇත. මෙම අභියාචනය මගින් ඉල්ලා සිටින්නේ 2010 වසරේ පැවැත්වූ ඒකාබද්ධ තැපැල් සේවාවේ "ආ" කාණ්ඩයේ 1 (ආ) ශ්‍රේණියේ තැපැල් සේවා නිලධාරී තනතුරුවලට උසස් කිරීම සඳහා කණිෂ්ඨ සේවකයන් සහ උප තැපැල් ස්ථානාධිපතීන් වෙනුවෙන් 2010.09.19 දින පැවැත්වූ සීමිත තරඟ

විභාගයේ ප්‍රතිඵල මත කරනු ලබන උසස්වීම් අභියාචකට නොලැබුණු බවත්, 1992 වසරේ තමා මෙම තනතුරට බැඳෙන විට මෙම තනතුරට බඳවා ගැනීමේ මූලික සුදුසුකම වූයේ අ.පො.ස (සා.පෙළ) සමත්වීම වුවත්, තමන් ගණිත අංශයෙන් අ.පො.ස (උ.පෙළ) හදාරා, මෙම තරඟ විභාගය ද සමත් වී, සුදුසුකම් සපුරා ඇති බවත්, වසර 25ක පමණ සේවා කාලයක් සහිත, සුදුසුකම් සපුරා ඇති තමාට, අදාළ උසස්වීම ලබා දීමට සහයෝගය දක්වන ලෙසට ය. අභියාචකගේ 2025.01.02 ලිඛිත දේශන මගින් මෙම උසස් කිරීම් ක්‍රියා පටිපාටියේ දී විවිධ අක්‍රමිකතා සිදුවී ඇති බවත්, ඒවා සනාථ කිරීමට විවිධ ලේඛන, තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ලබාගෙන ඇමුණුම් ලෙස ඉදිරිපත් කරන බවත්, අවස්ථා කිහිපයකදී 2023.10.04, 2023.11.28, 2024.02.25, 2024.07.29, 2025.01.02, යන දින වලදී මෙම අධිකාරයට ලබා දී ඇති ලිඛිත දේශන සහ ඇමුණුම් මගින් එය සනාථ කර ඇති බවත් දන්වා සිටී.

එම සියළු ලේඛන සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් මෙම අධිකාරයට ඉදිරිපත් කරන ලද ඔවුන්ගේ අංක PSC/APL/9/106/2017 හා 2020.06.17, 2023.03.29, 2023.06.28, 2023.10.24, 2024.06.27, 2024.07.11, 2024.11.26, නිරීක්ෂණ සහ ලිඛිත කරුණු ඉදිරිපත් කිරීම් සහ අදාළ ඇමුණුම් පිළිබඳව අවධානය යොමු කිරීමේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරමි.

01. තැපැල් දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ තැපැල් සේවාවේ "ආ" කාණ්ඩයේ 1 "ආ" ශ්‍රේණියේ තැපැල් සේවා තනතුරු වලට උසස් කිරීම සඳහා කණිෂ්ඨ සේවකයන් හා උප තැපැල් ස්ථානාධිපතීන් වෙනුවෙන් 2009.12.11 දින තැපැල්පති චක්‍රලේඛ 5/2009 යටතේ ඉල්ලුම්පත් කැඳවා ඇත. (සුදුසුකම් ආදිය සඳහන් කළද, පුරප්පාඩු ගණන සඳහන් කර නැත) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/APL/9/106/2017 හා 2020.06.17 දිනැති ලිපියේ 2 ඡේදය අනුව පුරප්පාඩු 210ක් පිරවීම සඳහා විභාගය 2010.09.19 දින පවත්වන ලද බව ප්‍රකාශ කර සිටී. මෙම විභාගය ප්‍රශ්න පත්‍ර 06කින් සමන්විත, භාෂාව, ගණිතය ඇතුළු තවත් විෂයයන් 04කින් සමන්විතය. එහිදී සියළුම විෂයන් සඳහා 40% ට වඩා වැඩියෙන් ලකුණු ලබා සමත් වූ අයදුම්කරුවන් 66 ක් සඳහා 2011.07.01 දින පත්වීම් ලබා දී ඇත.

02. තැපැල්පතිගේ 5/2009 චක්‍රලේඛනය මගින් ඒ වන තෙක් මෙම තනතුර සඳහා බඳවා ගැනීමට ක්‍රියාකළ 1993.03.01 දින ආයතන අධ්‍යක්ෂක විසින් අනුමත බඳවා ගැනීමේ පරිපාටිය (S O R) වෙනසකට භාජනය කර ඇත. 1993 බඳවා ගැනීමේ පටිපාටියට අනුව පැවති ක්‍රමය වූයේ සිංහල/දෙමළ භාෂාව, ගණිතය යන විෂයන් දෙකට 40% වඩා වැඩි සහ මුළු ලකුණු 40% (240) වඩා ලබන අයදුම්කරුවන් සුදුසුකම් ලබන බවත් ය. 5/2009

වක්‍රලේඛනය යටතේ සියළු විෂයන් සඳහා 40% වඩා වැඩි ලකුණු ලැබිය යුතුය යන කොන්දේසියක් පනවා ඇත. ඒ සඳහා අනුමැතිය තැපැල් අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ලබාගත් බවත්, ඒ අවස්ථාව වන විට රාජ්‍ය සේවා කොමිෂම අහෝසි වී නැවත ස්ථාපිතව නොතිබූ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2023.10.24 මෙම අධිකාරයට යොමු කළ නිර්දේශ ලිපියේ 03(3) ඡේදය මගින් සනාථ කර සඳහන් කර ඇත.

03. මෙම විභාගය සඳහා ලකුණු ලබා ගැනීමේ ක්‍රමයේ වෙනස්කම් නිසා විශාල පිරිසකට පත්වීම් ලබා ගැනීම සඳහා අවස්ථාව නොලැබීම මත, ඒ අය රාජ්‍ය සේවා කොමිෂමට අභියාචනා ඉදිරිපත් කර ඇත. එහෙත් ඒවා ප්‍රතික්ෂේප වීම මත, ඩබ්.වී.පී.ඉන්දික නැමැති අයෙකු විසින් AAT/119/2013/PSC අංකය යටතේ අභියාචනයක් ගොනු කර ඇත. මෙම විනිශ්වය අධිකාරය එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවට මේ පිළිබඳව නැවත සළකා බැලීමට උපදෙස් දී ඇත. රාජ්‍ය සේවා කොමිෂම විසින් 1993.03.01 පැරණි බඳවා ගැනීමේ පරිපාටිය යටතේ ඉතිරි පුරප්පාඩු 144 මෙම විභාගයේ ප්‍රතිඵල මතම බඳවා ගැනීමට එකඟවීම අනුව AAT/119/2013/PSC අභියාචනය ඉල්ලා අස්කර ගෙන ඇත.

04. රාජ්‍ය සේවා කොමිෂම 2023.10.24 ලිපියේ 04 ඡේදය අනුව ඉහත තීරණය මත 2010.09.19 දින පැවති ලිඛිත විභාගයේ ප්‍රතිඵල මත ලකුණු 298 ක් හෝ ඊට වැඩි ලකුණු ලබාගත් අයදුම්කරුවන් 149 දෙනෙකු කැඳවා සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර, (සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබාදීමක් නැත) 125 දෙනෙකු සඳහා 2011.07.01 දින සිට හිඟ වැටුප් නොගෙවීමේ පදනම මත පත්වීම් ලබා දී ඇත.

05. 2010.09.19 දින පැවැත්වූ අදාළ තරඟ විභාගයේ දී අභියාචක ලකුණු 265ක් ලබාගෙන කුසලතා අනු පිළිවෙලින් 302 ස්ථානයේ සිටි බවත්, එම නිසා සම්මුඛ පරීක්ෂණයට කැඳවීම් නොකළ බවත්, රාජ්‍ය සේවා කොමිෂම 2020.06.17 දින මෙම අධිකාරයට එවනු ලැබූ ලිපියේ 8 ඡේදයේ X යටතේ දන්වා සිටී. එසේ වුවත් රාජ්‍ය සේවා කොමිෂම මෙම අධිකාරයට එවන ලද 2024.06.27 ලිපියේ ජෙද 2 - II අනුව දක්වා සිටින්නේ අභියාචක ලකුණු 265 ලැබ, ලකුණු ලේඛණයේ කුසලතාවය අනුව 547 ස්ථානයේ සිටි බවයි. මේ පිළිබඳව අභියාචක චෝදනා කරනු ලබයි.

06. මෙම විභාගයේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් 10/02/09/52 ප්‍රතිඵල ශාඛාව අංක හා 2011/07/13 දින දරණ තැපැල්පති වෙත යවනු ලැබූ ලකුණු ලේඛන වල 89 පිටුවේ අනු අංක 1859 යටතේ ලකුණු 00 හා කුසලතා අනුපිළිවෙල 1256 දරණ ඩී.එම්.ආර්.දිසානායක සහ 91 පිටුවේ අනු අංක

1894 යටතේ ලකුණු 00 හා කුසලතා අනුපිළිවෙල 1256 යටතේ බී.යෝගරත්නම් නැමැති අයවලුන්ට පත්වීම් ලබාදී ඇති බව වැඩි දුරටත් ප්‍රකාශ කරයි.

07. එසේම විභාගය නියමිත පරිදි සමත් නොවූ, භාෂාව හා ගණිතයට 40% වඩා අඩු ලකුණු ලැබූ අයදුම්කරුවන් විභාග දෙපාර්තමේන්තුව නිකුත් කළ 2011.07.13 දින දරණ ප්‍රතිඵල ලේඛනයේ අංක 33, 34, 56, 63, 68, 74, 75, 77, 96, 106, ..... ආදි ලෙස 200 ක පමණ පිරිසක් ලකුණු ලේඛනයේ කුසලතා අනුපිළිවෙල අනුව මුලින් සිටින බවද ප්‍රකාශ කර සිටී. නමුත් ඒ අයට පත්වීම් දී තිබේද යන්න ස්ථිර කර නොමැත.

08. මෙසේ අභියාචක තුළ සැකය, කුතුහලය මතුවී ඇත්තේ තොරතුරු දැන ගැනීමේ පනත අනුව ලබාගත් තොරතුරු අනුව විවිධ අවස්ථාවලදී විවිධ තොරතුරු ඉදිරිපත් කිරීමයි.

මෙම විනිශ්චය අධිකාරයෙන් ද එම ගැටළුව පැහැදිලිව හඳුනාගෙන ඇත.

මෙම විභාගයේ ප්‍රතිඵල ලේඛන 5 පිළිබඳව සඳහන් වේ.

I. විභාග කොමසාරිස් ජනරාල්ගේ අංක 10/02/09/52 ප්‍රතිඵල ශාඛාව යටතේ විභාග කොමසාරිස් ජනරාල් හා නියෝජ්‍ය විභාග කොමසාරිස් අත්සන් කර පිටු 91 සමන්විත 2011.07.13 දින තැපැල්පති වෙත යවා ඇති අයදුම්කරුවන් 1899 දෙනෙකුගේ නම් සඳහන් ප්‍රතිඵල ලේඛනය,

II. තැපැල්පති විසින් රාජ්‍ය සේවා කොමිෂම වෙත යවා ඇති, රාජ්‍ය සේවා කොමිෂම විසින් මෙම අධිකාරයට එවන ලද 2023.06.28 ලැබුණ PSC/APL/9/106/2017 - අංක හා 2023.06.23 දින දරණ ලේඛනය.

ඇමුණුම් I නම් 66

ඇමුණුම් II නම් 125

III. තැපැල්පති විසින් 10/40/රා.සේ.කො/200/2018 යටතේ 2023.06.19 දින ලේකම් ජනමාධ්‍ය වෙත යැවූ නාම ලේඛනය.

එහි නම් 149 -

එච්.ඩී.සී.පී.ගුණසේකර - සභාපති නියෝජ්‍ය තැපැල්පති (පාලන)

කේ.ඒ.එන්.පී.කදනආරච්චි - ජේ.පාලන ලේකම් - තැපැල් මූලස්ථානය

ආර්.එම්.එම්.රූපසුන්දර බණ්ඩාර - අධිකාරී- උප තැපැල් කාර්යාලය

යන අය අත්සන් කර ඇත. විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු මෙම ලේඛනයට අත්සන් තබා නැත.

IV. I.P පෙරේරා (අභියාචක) ඇමුණුම් 6 ලෙස ඉදිරිපත් කරන තැපැල්පති යැවූ තොරතුරු පනත යටතේ ලබාගත් අනුර එදිරිසිංහ, විභාග කොමසාරිස් හා ගුණරත්න අත්නායක නියෝජ්‍ය විභාග කොමසාරිස්ගේ අත්සන් සහිත නම් 70ක නාම ලේඛනය.

V. විභාග දෙපාර්තමේන්තුව නියෝජ්‍ය විභාග කොමසාරිස් (පාලන) එල්.පී.එස්. සමරකෝන්ගේ අත්සනින් වි.දෙ/1/තො.දැ.ප/RIT/01/060(2023) අංක හා 2023.06.16 දින අයි.සී.පෙරේරා මහතා වෙත යවා ඇති ලිපියේ ප්‍රතිඵල ලේඛන තැපැල්පති වෙත යැවූ දිනය 2011.05.06 ලෙස සඳහන්ව ඇත. 2011.05.06 දින යැවූ බව සඳහන් නාම ලේඛනය - එහි තොරතුරු කිසිවක් නොමැත.

ඒ අනුව එකම විභාගයක විවිධ අවස්ථා අනුව සකසන ලද ලකුණු ලේඛන සහිත නාම ලේඛන කිහිපයක් තිබීම අභියාචකට මෙන්ම අන් අයට ද සැකය හා අවිශ්වාසය මතුවන බව පෙනේ.

අදාළ විභාගය පවත්වනු ලැබුවේ විභාග දෙපාර්තමේන්තුවෙන් නිසාත්, ඒ අයට විභාග පැවැත්වීම හා ප්‍රතිඵල ලබාදීම පිළිබඳව මනා දැනුමක් පළපුරුද්දක් අවබෝධයක් මෙන්ම අදාළ මානව සහ අනකුත් සම්පත් ද තිබෙන නිසා,

I සියළුම විෂයන්ට 40% වඩා ලකුණු ලැබූ අයගේ නාම ලේඛනයක්. (ප්‍රමඛතා අනුපිළිවෙල සමඟ)

II. සිංහල හා ගණිතය යන විෂයන් සඳහා 40% හා මුළු එකතුව ලකුණු 240 40% X විෂයන් 6) වැඩි අයගේ නාම ලේඛනයක්. කුසලතා අනුපිළිවෙල අනුව.

III. අදාළ විභාගයෙන් සියළුම අපේක්ෂකයන් ලැබූ එක් එක් විෂය පිළිබඳව සහ මුළු ලකුණු පිළිබඳ සඳහන් කර කුසලතාවය අනුපිළිවෙල අනුව සැකසූ ලේඛනයක් තැපැල්පති වෙත ලබාදුන්නා නම්, මේ ප්‍රශ්නය මතු වන්නේ නැත. අදාළ සැක සංකා සියල්ල අහෝසි වේ.

විභාග දෙපාර්තමේන්තුව විසින් සැකසිය යුතු ලකුණු කුසලතා අනුපිළිවෙල සමඟ නාම ලේඛනයක් තැපැල් දෙපාර්තමේන්තුව විසින් සකසා ඇත. නියෝජ්‍ය තැපැල්පති ගුණසේකර මියගේ සභාපතිගේ අත්සන් කර ඇති 149 නාම ලේඛනය ඒ තම තමන්ගේ වගකීම් හා යුතුකම් නිසි පරිදි ඉටුනොවූ බවට හොඳම සාක්ෂියකි. (ඉහතින් අංක III යටතේ සඳහන් නම් 149 ක නාම ලේඛණය.)

ඉහතින් අංක I යටතේ 2011.07.13 දින ලේඛනයේ ලකුණු "00" ලෙස සඳහන් ඩී.එම්.ආර්.දිසානායක මයා හට අංක 70018143 යටතේ ආර්.පී.එස්.

රාජපක්ෂ මයාගේ ලකුණු දන්වා යවා ඇත. එසේම ලකුණු “00” ලැබූ යෝතිරත්න මයාට එල්.තාහිර් මයාගේ ලකුණු ලේඛනය යවා ඇත. මෙම ප්‍රශ්නය තැපැල්පති විසින් 11/20/525/172/EX/2016 හා 2016.12.28 ලිපිය අනුව විභාග කොමසාරිස්ගෙන් විමසූ විට විභාග කොමසාරිස්ගේ අංක 10/02/09/52 හා 2017.03.27 දින දරණ ලිපිය මගින් ඔහු දක්වා ඇත්තේ, වසර 05කට වඩා වැඩි ලේඛන ඔවුන් සතුව නැති බවය. එසේම අභියාචන කරන අයට යම් සහනයක් සැලසීමට ඒ අයගේ විරුද්ධතාවයක් නැති බවත්ය. ඒ අනුව අදාළ දෙපාර්තමේන්තුව පිළිබඳව අයඳුම්කරුවන් මෙන්ම රටේ ජනතාව අතර සැක සංකා සහ විශ්වාසයේ පලුදු වීමක් සිදුවීමට ඇති ඉඩකඩ ඉතාමත් වැඩිය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ දැන්වීම මත 2017.10.06 කේ.ඒ.එස් සේනාධීර - අතිරේක ලේකම් ජනමාධ්‍ය, ඩී.පී.ආර්. ධර්මසූරිය විභාග කොමසාරිස් - ප්‍රතිඵල, එච්.ඩී.සී.පී.ගුණසේකර මිය - නියෝජ්‍ය තැපැල්පති, යන අයගෙන් කමිටුවක් පිහිටුවා ඇත. අදාළ කමිටුවේ නිරීක්ෂණ මත, රාජ්‍ය සේවා කොමිෂම මගින් 2015.05.04 දින ලිපිය මගින් ඩී.එම්.ආර්.දිසානායක, බී.යෝතිරත්නම්, ආර්.පී.එස්.සී.රාජපක්ෂ, එම්.එල්.තාහීර්, ඩබ්.ඒ.පී.වික්‍රමසිංහ යන අයඳුම්කරුවන් 5 දෙනාටම පත්වීම් ලබාදීමට තීරණය කර ඇත. එස්.එම්.ඒ.එස්.සිරිවර්ධන යන අය විශ්‍රාම ගොස් ඇති බැවින් ඒ නම ප්‍රතික්ෂේප කර ඇත.

මෙම කටයුත්තේ දී විභාග දෙපාර්තමේන්තුව තමාගේ වගකීම් හා යුතුකම් නිවැරදිව ඉටුකර නැති බව පෙනේ. ඒ නිසාම අදාළ නාම ලේඛන කිහිපයක් සැකසීම සහ කමිටු පත් කිරීමට සිදුවී ඇත. අනෙක් අතට තැපැල් දෙපාර්තමේන්තුව තම වගකීම් නිසි අයුරින් ඉටුකර නැති බව පෙනේ. තමාට අවශ්‍ය ලේඛන මොනවාද යන්න නිශ්චිතව සඳහන් කර, නියමිත වේලාවකදී විභාග දෙපාර්තමේන්තුව මගින් ලබා ගැනීම (වසර 5, 6 යනතුරු නොසිට) ඒ අයගේ වගකීම වේ. ඒ අඩුපාඩුව නිසා තවත් පිරිසක් අපහසුතාවයට පත්විය යුතු නැත. යම් විභාග පරිපාටියක් වෙනස් කරන්නේ නම් අදාළ සියළු දෙනා දැනුවත් කර එකඟතාවය මත එය සිදුකළ යුතුය. එසේ නැතිව එකම විභාගයක ප්‍රතිඵල මත බඳවා ගැනීමේ පරිපාටි දෙකක් යටතේ කටයුතු කිරීම මෙම අර්බුදයට හේතු වී ඇත. අදාළ කාලයේ රාජ්‍ය සේවා කොමිෂම අක්‍රියව පැවතිම ද මේ සඳහා විශාල වශයෙන් බලපෑ ඇති බව පෙනේ.

ඉහත සඳහන් සියළු කරුණු කෙරේ ගැඹුරින් අවධානය යොමු කිරීමේ දී මෙම අභියාවකට අසාධාරණයක් සිදුවී ඇතැයි එකහෙලාම ප්‍රකාශ කළ නොහැක. එසේ වුවත් අභියාවක සඳහන් කරන පරිදි අදාළ ලකුණු ලේඛනයේ ලකුණු ,00, ලෙස සඳහන්ව තිබූ ඩී.එම්.ආර්. දිසානායක හා බී.යෝගරත්නම් නැමැති

අභියාචකයන් දෙදෙනෙක් සඳහා සහන සලසා දී පත්වීම් ලබාදීම අභියෝගයට ලක්කරයි.

නමුත් මෙම අයට පත්වීම් ලබාදී ඇත්තේ විශේෂ කමිටුවක නිර්දේශ මතය. එම කමිටුවේ නිර්දේශයන් අභියෝගයට ලක් කරන කරුණු කිසිවක් ඉදිරිපත් ව නැත. ඒ නිසා අදාළ කමිටු නිර්දේශය වැරදියැයි ප්‍රකාශ කිරීම අපහසුය. එසේම ලකුණු 298ට වඩා අඩුවෙන් ලකුණු ලැබූ වෙනත් කිසිවෙකුට හෝ පත්වීම් ලබා දී ඇති බවක් ද අනාවරණය නොවේ. මේ අනුව ලකුණු 265 ලබාගත් පමණින් සහ අදාළ සුදුසුකම් සපුරා ඇති පමණින්ම මෙම අභියාචකට පත්වීම් ලබාදීම නිර්දේශ කිරීම අපහසුය. ලකුණු 265 වැඩි සහ 298 අතර ලකුණු ලැබූ විශාල පිරිසක් සුදුසුකම් ලබා ඇත. අභියාචකට පමණක් පත්වීම් දීම එම පිරිසට කරන බලවත් අසාධාරණයකි.

ඉහත සඳහන් සියලුම කරුණු කෙරේ අවධානය යොමු කිරීමේ දී රාජ්‍ය සේවා කොමිෂම මගින් ලබා දී ඇති අංක PSC/APL/9/106/2017 හා **2020.01.16** දින තීරණය වෙනස් කිරීමට තරම් ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් ව නැත. ඒ අනුව අභියාචනය ප්‍රතික්ෂේප කරමි.

මෙම තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව, තැපැල්පති හා අභියාචක වෙත දන්වන්න.

ජේ.ජේ.රත්නසිරි
සාමාජික.

මම එකඟ වෙමි.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
සභාපති

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-